**UNIVERSITY OF PERADENIYA**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**පළමු වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය**
**(බාහිර - නව නිර්දේශය) අගෝස්තු 2018**

1st YEAR (100 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL - NEW SYLLABUS) AUGUST 2018

**ඇසහැ 102 සංසන්දනාත්මක ආර්ථික සංවර්ධනය**

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු මුලු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි
අවම වශයෙන් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
කාලය : පැය තුනයි (03)

---

**1 කොටස - එක්සත් රාජධානිය**

1. (i) "නූතනත්වය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04 යි)
   (ii) නූතනත්වයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 06 යි)
   (iii) නවීන ආර්ථික වෘද්ධිය කෙරෙහි නූතනත්වයේ කාර්යභාරය හා වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

2. (i) කොටුකිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 06යි)
   (i) මහා බ්‍රිතාන්‍යයේ කොටුකිරීමේ ව්‍යාපාරයේ සමාජ හා ආර්ථික බලපෑම විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 14යි)

3. (i) 19 වන ශත වර්ෂයේ අග භාගයේ සිදු වූ කාර්මික වර්ධනය තීරණය කිරීමට කාර්මික විප්ලවය යන යෙදුම කෙතරම් සුදුසුද? විස්තර කරන්න. (ලකුණු 10යි)
   (ii) "මහා බ්‍රිතාන්‍යයේ කපුපිලි කර්මාන්තයේ සිදුවූ විප්ලවීය වෙනස්වීම සඳහා තීරණාත්මක ලෙස බලපෑ ප්‍රභල සොයාගැනීම් හතරක් හේතු විය". සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

4. 19 වන ශත වර්ෂයේදී මහා බ්‍රිතාන්‍යයේ දුම්රිය ප්‍රවාහන කර්මාන්තයේ සිදුවූ වර්ධනයේ ඉදිරිපස හා පසුපස සම්බන්ධතා විස්තර කරන්න. (ලකුණු 20යි)

5. මහා බ්‍රිතාන්‍ය සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ඒවායින් ඕනෑම හතරකට කෙටි සටහන් ලියන්න.

   (i) 1815 ධාන්‍ය නීති
   (ii) චර්ටිස්ට් ව්‍යාපාරය
   (iii) නොර්ෆෝක් ක්‍රමය
   (iv) 1824න් පසු වෘත්තීය සමිති
   (v) 'අදෘශ්‍යමාන හස්තය' සංකල්පය (ලකුණු 04 x 05 = 20)

## II කොටස - ශ්‍රී ලංකාව

6. 1884-1896 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ ප්‍රධාන උපනතීන් විස්තර කර එම කාලපරිච්ඡේදයේ තේ කර්මාන්තයේ ශීඝ්‍ර ව්‍යාප්තිය කෙරෙහි බලපෑ සාධක දක්වන්න. (ලකුණු 20යි)

7. ශ්‍රී ලංකාවේ ගැමි කෘෂිකර්මාන්තය මත බ්‍රිතාන්‍ය ඉඩම් ප්‍රතිපත්තියේ බලපෑම විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 20යි)

8. නිදහස ලැබීමට පෙර ශ්‍රී ලංකා ආර්ථිකයේ ව්‍යුහය විශ්ලේෂණය කිරීමට 'ද්විත්ව ආර්ථිකය' යන යෙදුම කොතරම් සුදුසු වේද? (ලකුණු 20යි)

9. බ්‍රිතාන්‍ය පාලන සමයේ ශ්‍රී ලංකාවේ ගැමි කෘෂිකර්මාන්තයේ සාපේක්ෂ නිශ්චලනයට හේතුවූ සාධක ලෙස ඔබ ගෙනහැර දක්වන්නේ මොනවාද? (ලකුණු 20යි)

10. ශ්‍රී ලංකාව සැලකිල්ලට ගනිමින් පහත සඳහන් ඒවායින් ඕනෑම හතරකට කෙටි සටහන් ලියන්න.

(i) මුඩු බිම් පනත
(ii) කොල්බෲක් කොමිසමේ ආර්ථික ප්‍රතිසංස්කරණ
(iii) 1900-1934 අතර කාලයේ රබර් කර්මාන්තය
(iv) 1802-1833 කාලපරිච්ඡේදයේ කුරුඳු වෙළෙඳාම
(v) බ්‍රිතාන්‍ය පාලනය යටතේ වෘත්තීය සමිති (ලකුණු 04 x 05 = 20)